**කොළඹ විශ්වවිද්‍යාලය**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී විශේෂ උපාධි තෙවන වසර පරීක්ෂණය**

**පළමු සෙමෙස්තරය - 2016/2017**

**SLG 3158 –සිංහල නාට්‍ය සම්ප්‍රදාය**

(පැ දෙකයි)

ප්‍රශ්න **හතරකට (04) පමණක්** පිළිතුරු සපයන්න.

---

1. "ලෝකවෘත්තානුකරණම් නාට්‍ය මේ තද් භවිෂ්‍යති." මේ නිර්වචනය නාට්‍ය කලාවේ ස්වභාවය හඳුනා ගැනීමට කෙබඳු පිටිවහලක් සපයයි ද?

2. " අභිචාරාර්ථයෙන් පවත්වනු ලබන ශාන්ති කර්මවල හෙළ නාට්‍ය කලාවේ ප්‍රභවය සංකේතවත් කරයි." විමසන්න

3. නාට්‍යයක කලාත්මක බවේ සාධනීය අවස්ථාව වන්නේ කථා සන්දර්භය යි. පෙරාපර දෙදිග විචාරක අදහස් ඇසුරින් සමාලෝචනයක යෙදෙන්න.

4. "හෙළ නාට්‍ය වංශ කතාවේ නාඩගම් චිරස්ථායී නාට්‍ය සම්ප්‍රදායයක් විය." කෙටි විවරණයක් සහිත ව සම්භාව්‍ය නාට්‍ය විෂයෙහි මෙමගින් සිදු වූ බලපෑම විචාරාත්මක ව අගයන්න.

5. පහත සඳහන් නාට්‍ය නිර්මාණ අතුරින් දෙකක විවරණය වන සමාජ දෘෂ්ටිය විමසා බලන්න

    i. හුණුවටයේ කථාව
    ii. නරි බෑනා
    iii. පේමතො ජායතී සෝකෝ
    iv. සුබ සහ යස
    v. හංකිති දහතුන

*අ.පි.බ*

6. "ගැටුමක් නැති තැන නාට්‍යයක් නැත" (No conflict no drama) මේ ප්‍රකාශය සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාටකයේ කථා වින්‍යාසය තුළ ක්‍රියාත්මක වන අයුරු පෙන්වා දෙන්න.

*********************